අපා වාසීන්ගෙන් ඉන් බැහැරට එන අවසානයා ගැනත් එමෙන්ම ස්වර්ග වාසීන්ගෙන් එය තුළට පිවිසෙන අවසානයා ගැනත් සැබැවින්ම මම මැනවින් දනිමි. නිරයෙන් බැහැර වී බඩගාමින් එන මිනිසෙකි. එවිට අල්ලාහ් ඔහුට මෙසේ පවසනු ඇත. “ඔබ යනු. ස්වර්ගයට පිවිසෙනු. පසුව ඔහු ඒ වෙත පැමිණෙයි. සැබැවින්ම එය පිරී පවතිනු ඇතැයි ඔහු හිතෙන් මවා ගනියි. පසුව නැවත හැරී ඇවිත් ‘මාගේ පරමාධිපතියාණනි! එය පිරී තිබෙනු මම දුටුමි.

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අල් මුගීරා ඉබ්නු ෂූඃබා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “මූසා (අලයිහිස් සලාම්) තුමා තම පරමාධිපතිගෙන් ස්වර්ගවාසීන්ට හිමිවන අවම තරාතිරම කුමක්දැ?යි විමසීය. ඔහු: “සවර්ගවාසීන් ස්වර්ගයට පිවිසීමෙන් පසුව පැමිණෙන මිනිසෙකු වෙයි. ඔහුට ‘ඔබ ස්වර්ග උයනට පිවිසෙනු’ යැයි පවසනු ලැබේ. එවිට ඔහු මාගේ පරමාධිපතියාණනි, එය කෙසේ හැකි වන්නේ ද? ජනයා ඔවුනොවන්ගේ තරාතිරම් වලට ගොඩ බැස ඇත. ඔවුන් ගන්නා දේවල් ඔවුන් ලබා ඇත. එවිට ඔහුට මෙසේ පවසනු ලැබේ. මෙලොව රජවරුන්ගෙන් එක රජවරයකුට හිම රාජ්යයක් මෙන් යමක් ඔබට හිමි වීම ගැන ඔබ සතුටු වන්නෙහිද? යැයි විමසනු ලැබේ. එවිට ඔහු: ‘මාගේ පරමාධිපතියාණනි, මම ඒ ගැන තෘප්තියට පත්වූයෙමි. පසුව ඔහුට එයත් ඒ හා සමාන තවෙකක්, ඒ හා සමාන තවෙකක්, ඒ හා සමන තවෙකක් හා ඒ හා සමාන තවෙකක් ඇත. පස්වැන් වතාවෙහි මාගේ පරමාධිපතියාණන් මම ඒ ගැන තෘප්තියට පත් වූයෙමි. පසුව ඔහු: මෙය ඔබටය ඒ හා සමාන දස ගුණයක් ද ඔබටය. ඔබේ නෙත් පිනවන ඔබේ ආත්මය ප්රිය කරන දෑ ඔබ සතු වේ. යැයි පවසයි. පසුව ඔහු මාගේ පරමාධිපතියාණනි, මම තෘප්තියට පත්වූයෙමි යැයි පවසනු ඇතැයි පැවසීය. පසුව මූසා තුමා තවදුරටත්: “ඔවුන් අතර වඩාත් ඉහළ තරාතිරම් ඇත්තා කවරෙකුදැ?යි විමසා සිටියේය. ඔහු: ඔවුන්ගේ ගරුත්වය මාගේ අතින් සිටවීමට මා අපේක්ෂා කොට එය මා නිමා කළෙමි. කිසිදු ඇසක් දැක නැත. කිසිදු කනක් අසා නැත. කිසිදු මිනිස් හදවතක් එය කල්පනය කර නැත.” අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “අපා වාසීන්ගෙන් ඉන් බැහැරට එන අවසානයා ගැනත් එමෙන්ම ස්වර්ග වාසීන්ගෙන් එය තුළට පිවිසෙන අවසානයා ගැනත් සැබැවින්ම මම මැනවින් දනිමි. නිරයෙන් බැහැර වී බඩගාමින් එන මිනිසෙකි. එවිට අල්ලාහ් ඔහුට මෙසේ පවසනු ඇත. “ඔබ යනු. ස්වර්ගයට පිවිසෙනු. පසුව ඔහු ඒ වෙත පැමිණෙයි. සැබැවින්ම එය පිරී පවතිනු ඇතැයි ඔහු හිතෙන් මවා ගනියි. පසුව නැවත හැරී ඇවිත් ‘මාගේ පරමාධිපතියාණනි! එය පිරී තිබෙනු මම දුටුමි’ යැයි පවසයි. නැවතත් උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. නුඹ යනු. ස්වර්ගයට පිවිසෙනු. පසුව නැවත ඒ වෙත පැමිණෙයි. සැබැවින්ම එය පිරී පවතිනු ඇතැයි හිතෙන් මවා ගනියි. පසුව නැවත හැරී ගොස් මෙසේ පවසයි. අහෝ පරමාධිපතියාණනි එය පිරී තිබෙනු මා දුටුමි යැයි පවසයි. එවිට කීර්තිමත් සර්වබලධාරී අල්ලාහ්: නුඹ ගොස් ස්වර්ගයට පිවිසෙනු. සැබැවින්ම ඔබට මෙලොව හා සමාන දෙයක් හා ඒ හා සමාන දස ගුණයක් ඔබට හිමිය. එසේ නැතහොත් මෙලොව හා සමාන දස ගුණයක් ඔබට හිමිය. එවිට ඔහු ‘ඔබ

පරමාධිපතියාණන්ව සිටියදී ඔබ මට විහිළු කරන්නෙහි ද? එසේ නැතහොත් මා දෙස බලා සිනහසෙන්නෙහු ද?” යැයි විමසයි. වාර්තාකරු මෙසේ පවසයි. “සැබැවින්ම මම අල්ලාහ්ගේ දූතයාණන් එතුමාගේ කෘන්තක දත් හෙළිවන තරමට සිනහ සී “මෙය ස්වර්ගවාසීන්ගේ පහත්ම තරාතිරමයි.” යැයි පවසා සිටිනු මම දැක ඇත්තෙමි. යැයි පැවසීය.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත - බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

අල්ලාහ්ගේ උපකාරය ඔහුගේ කරුණාවේ විශාලත්වය පැහැදිලි කිරීමකි. එමෙන්ම ස්වර්ග වාසීන්ට හිමිවන තරාතිරම ද පැහැදිලි කිරීමයකි. සැබැවින් ඔවුනට හිමි අවම තරාතිරම වන්නේ මෙලොව රජකු පාලනය කරන දෑ මෙන් කිහිප ගුණයක් බුක්ති විඳීමට සැළැස්වීමය.

http://sunnah.global/hadeeth/si/show/10405